**තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය - 2012**

**----------------------------------------------**

1. මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ නියමකර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 මූල්‍ය කාර්ය සාධනය

---------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු. 381,595 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.3,590,951 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා සංරචක වශයෙන් ව්‍යාපෘති වියදම් ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| උපදේශක ගාස්තු | 300,000 | 1,411,850 | 1,711,850 |
| ප්‍රචාරණ සහ ප්‍රකාශනයන් | - | 518,643 | 518,643 |
| පරිපාලන වියදම් | 81,595 | 866,988 | 948,583 |
| වෙනත් ව්‍යාපෘති වියදම් | - | 408,864 | 408,864 |
| මූල්‍ය පිරිවැය | - | 3,011 | 3,011 |
| | 381,595 | 3,209,356 | 3,590,951 |

2.2 විශේෂ (ඩොලර්) ගිණුම

ව්‍යාපෘතිය ආරම්භයේ සිටම විශේෂ ( ඩොලර්) ගිණුමක් ක්‍රියාත්මකව නොතිබුණි.

3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්පූර්ණ ව්‍යාපෘතිය කාල පරිච්ඡේදයම ආවරණය වන පරිදි පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරි සැලැස්මක් සකස් කල යුතු වුවද 2012 දෙසැම්බර් 31 දින දක්වාම එබඳු සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන සහායකවරයකු ව්‍යාපෘතියේ තොරතුරු තාක්ෂණික උපදේශකවරයෙකු ලෙස පත්කර තිබූ අතර මාස තුනක කාලයක් සඳහා රු.225,000 ක් මාසිකව දීමනාවක් වශයෙන් ගෙවා තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතු කොටගෙන ඔහුගේ සේවය ඵලදායී වී නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක නොවීම හේතු කොට ගෙන 2011 නොවැම්බර් සිට රු.6,455,222 ක මුදලක් බැංකු ගිණුමේ නිශ්කාර්යව තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.237,388 ක් වටිනා ජංගම නොවන වත්කම්වලට අදාළ භෞතික සත්‍යාපන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමේ 2.03 සහ 2.04 වගන්තිවලට අනුකූලව සේවා ගාස්තු සහ බැදීම් ගාස්තු ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4. කාර්යසාධන සමාලෝචනය
-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හෝ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘතියේ කටයුතුවල කාර්ය සාධනය ඇගයීමක් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ප්‍රතිපාදන සමග සැසදීමේදී 0.28% ක් පමණක් අරමුදල් උපයෝජනය කර තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍යායනය, අයවැයගත ප්‍රතිපාදනය සහ අරමුදල් උපයෝජනය පිළිබඳ සමහර සංඛ්‍යා පහත දැක්වේ.

(i) මූල්‍ය ගිවිසුමේ මූල්‍යායනය කිරීමට එකඟ වූ මුදල විගැහි මිලියන 11.6 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය රු.මිලියන 132 ක් විය.

(iii) වර්ෂය තුළ අරමුදල් උපයෝජනය රු.381,595 ( එ.ජ.ඩො. 381.5) ක් පමණක් විය.